## ජාතික නීති සම්මේලනය 2023 - ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL)

## 2023 මාර්තු 12 ඉරිදා උදේ 9.00-10.00

## ඕක් රූම්- සිනමන් ග්‍රෑන්ඩ්, කොළඹ 03

සුභ උදෑසනක් වේවා. ඔබ ශ්‍රී ලංකා ජාතික නීති සමුළුව ආරම්භ කරන අද උදෑසන මෙම සම්භාවනීය පිරිස ඇමතීමට ලැබීම මට ලැබුණු ගෞරවයක් වනවා. මෙරට නීතිඥ වෘත්තියේ හඬ ලෙස නීතිඥ සංගමය නීතිමය යටිතල පහසුකම්වල අත්‍යවශ්‍ය අංගයක් වනවා. ශ්‍රී ලංකාවට මේ මොහොතේ අත්‍යවශ්‍ය වන නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ඔබේ කැපවීම ප්‍රදර්ශනය කර ඇති බැවින් නීති වෘත්තිකයන්ගේ සහ මහජනතාවගේ ගෞරවය ඔබට හිමි වී තිබෙනවා.

ශ්‍රී ලංකාව වත්මන් ආර්ථික හා දේශපාලන අභියෝග වලට මුහුණ දෙන මේ අවස්ථාවේ මෙම භූමිකාව වඩාත් තීරණාත්මක වී තිබෙනවා. දීප්තිමත් අනාගතයකට මග පෙන්වීම සඳහා BASL විසින් නීතිය ක්‍රියාත්මක කරනු ඇති. එමනිසා අද ඔබ හා එක්වීමට ලැබීම විශේෂ ගෞරවයක් වනවා. මෙම රැස්වීම ඇමතීම මට විශේෂයෙන් සතුටට කරුණක් වන්නේ එය බාල වියේ මා කැලිෆෝනියාවේ හැදී කාලයේ මට තිබූ සිහිනයකට මා නැවත ගෙන යන බැවින්. එවකට මට අවශ්‍ය වූයේ සමාජයේ යහපත උදෙසා සහ යුක්තියට සහය වන වෘත්තියක් වූ නීතිඥවරියක් වීමටයි.

අවසානයේ මම රාජ්‍යතාන්ත්‍රික වෘත්තිය තෝරා ගත්තා. කෙසේ වෙතත්, වෘත්තීය අභියෝගවලට මුහුණ දෙන විට, මා, මගේ පවුල, මගේ රට සහ සෙසු ලෝකය සඳහා මට සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය දේ පිළිබඳව මට මතක් කරගැනීමට මා ඒ මූලික වටිනාකම් වෙත ආපසු යොමුවනවා.

ශ්‍රී ලංකාව සහ අමෙරිකාව අතර ද්විපාර්ශ්වික සබඳතාවයේ 75 වැනි සංවත්සරය යෙදෙන මේ වර්ෂයේ නීති වෘත්තිය තුළ ගැබ් වී ඇති මූලික වටිනාකම් අන් කවරදාටත් වඩා වැදගත් වනවා. මිනිසුන්, හවුල්කාරිත්වය සහ ප්‍රගතිය වැදගත් වනවා. ලොව පුරා ප්‍රජාතන්ත්‍රවාදය පීඩනයට ලක්ව ඇති අතර නීතියේ ආධිපත්‍යය නොමැතිව කිසිදු ප්‍රජාතන්ත්‍රවාදයක් පවතින්නේ නැහැ. ඒ අගනා නීතියේ ආධිපත්‍යයෙහි මුරකරුවන් ඔබයි.

ආරම්භයේ සිටම අප දෙරට අතර සම්බන්ධතාවය, ස්වාධීන අධිකරණයක වැදගත්කම ඇතුළුව හවුල් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත පදනම් වී තිබෙනවා. සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන්ට තමන් සැලකිල්ල යොමු කරන කරුණු සාමකාමීව ප්‍රකාශ කිරීමට සහ පාලනයට සහභාගී වීමට ඇති අයිතීන් සඳහා එක්සත් ජනපදයේ සහයෝගය නොවෙනස්ව ලැබෙනවා.

නිදහස් මැතිවරණ පිළිබඳ රටේ සාඩම්බර ඉතිහාසය එම අයිතිවාසිකම්වලට මූලික වන අතර, පුරවැසියන්ට සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගයෙන්, සහ ස්වාධීන අධිකරණයක් තුළ සුදුසුකම් ලත් නීති නියෝජනයක් හරහා, රජය වෙත සෘජුවම හඬ නැගීමට ලබා දීමේ හැකියාව ඉන් ලබා දෙනවා. අප සාකච්ඡාවට ගනිමින් සිටින පළාත් පාලන මැතිවරණය ඉතා තීරණාත්මක වන්නේ එබැවින්.

මේ සම්මන්ත්‍රණය පවත්වන අතරතුර, නීතිවේදීන් බවට පත්වීම සඳහා ඔබ පෙළඹවූ කාරණා පිළිබඳව සිතා බලන මෙන් මා ඔබව දිරිගන්වනවා.

නීති විද්‍යාලයට අයදුම් කිරීමටත් එම දුෂ්කර ගමනට මුහුණ දීමටත් ඔබව පෙළඹවූයේ කුමක්ද? නීති විද්‍යාලයේ එම පළමු දිනයේ ඔබේ හැඟීම් ගැන මොහොතකට මෙනෙහි කරන්න, නීති විද්‍යාලයේ අභියෝග සියල්ලට සාර්ථකව මුහුණ දීම වෙහෙස මහන්සි වී වැඩ කිරීම ආරම්භය පමණයි. මේ සියළුම වෙහෙස මහන්සිය හුදෙක් වැටුපක් ලබාගැනීමෙන් ඔබ්බට යන උසස් අරමුණක් සඳහා වියයුතුයි.

පසුගිය වසරේ විරෝධතා අතරතුර, ඔබේ සාමාජිකයින් 300 කට වැඩි පිරිසක් ඒ මොහොතේ නීතියේ ආධිපත්‍යය සහ නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම සහතික කිරීම සඳහා අත්අඩංගුවට ගත් පුද්ගලයින් වෙනුවෙන් පෙනී සිටියා. ඒ අතරම, ප්‍රචණ්ඩත්වයේ හෝ පොදු දේපළ විනාශ කිරීමේ යෙදෙන අයට නොමිලයේ නීති සහාය ලබාදීම ප්‍රතික්ෂේප කරන බව පැහැදිලි කරමින් ඔබ විනය දිරිමත් කළා. ඔබගේ ක්‍රියාවන් නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම පිළිබඳව කළ විස්මිත භෞතික ප්‍රකාශනයක් වූවා.

එම සිදුවීම් විස්මයජනක හා වැදගත් සිදුවීම් වුවත්, ඒවා ඔබේ සමස්ත සංගමයේ බලපෑමේ පුළුල්බව සහ ගැඹුර නියෝජනය කරන්නේ නැහැ. ඔබ ප්‍රගුණ කරන්නේ අපරාධ නීතිය හෝ සිවිල් නීතිය වේවා, ශ්‍රී ලාංකික සමාජයේ සහ ආර්ථිකයේ ඵලදායි ක්‍රියාකාරිත්වය සඳහා ඔබේ කාර්ය භාරය ඉතා වැදගත් වනවා. ඔබගේ දෛනික වැඩ කටයුතු ප්‍රවෘත්ති සිරස්තලවලට එක් නොවනවා විය හැකියි. නමුත් එය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සපයන ශක්තිමත් පදනම සඳහා එක්සත් ජනපදයේ සහ තවත් බොහෝ අයගේ සහයෝගය යොමු කරගන්නවා.

ඒ කැපවීම පිළිබඳ අවධාරණය කරන්නට මා කැමතියි. පසුගිය වසර කිහිපය තුළ නීති ආධාර සැපයීමට, වැදගත් නීති පිළිබඳ දැනුවත් කිරීමට, සහ යුක්තිය ආයතන සහ ක්‍රියාකාරීන්ගේ කාර්ය සාධනය ශක්තිමත් කිරීමට අධිකරණ ක්ෂේත්‍රයට ලබාදුන් එක්සත් ජනපද සහාය උපකාරී වී තිබෙනවා.

අද දිනයේ සම අනුග්‍රාහකයා වන ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනය සහ එක්සත් ජනපද අධිකරණ සහ වාණිජ දෙපාර්තමේන්තු හරහා ශ්‍රී ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රයේ

එක්සත් ජනපද හවුල්කාරිත්වයේ පුළුල් බව තුළින් පිළිබිඹු වන්නේ මෙම කාර්යයේ ප්‍රමුඛතාවය සහ තිරසාර සහ සර්වග්‍රාහී සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාව දරන වෑයම් පිළිබඳව අපගේ ඇති ගෞරවය යි.

උදාහරණයක් ලෙස, USAID හි කාර්යක්ෂම හා ඵලදායී යුක්තිය වැඩසටහන පරිපාලන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ අධිකරණ අංශයේ පුද්ගලයින්ගේ ධාරිතාව වැඩි කිරීම මගින් ශ්‍රී ලංකා අධිකරණ ක්ෂේත්‍රය ශක්තිමත් කරනවා. ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු අධිකරණ අංශයේ ආයතන සමඟ වැඩ කරමින්, විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රම, ආගමන, ඉඩම් නීති, නීති පර්යේෂණ, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය සහ සමාජ සර්වග්‍රහණය සහ වෘත්තීය ආචාර ධර්ම වැනි මාතෘකා පිළිබඳ අඛණ්ඩ නීති අධ්‍යාපනයක් USAID විසින් ලබා දී තිබෙනවා.

USAID, සිද්ධි කළමනාකරණ යහපරිචයන් සහ මෙවලම් ක්‍රියාවට නංවමින්, විසඳීමට ගොඩ ගැසී ඇති මිලියන භාගයකට වඩා වැඩි නඩු ප්‍රමාණයක් විසඳීමට ද උපකාර කරනවා. මීට අමතරව, කොළඹ සිට සේවය කරන එක්සත් ජනපද අධිකරණ දෙපාර්තමේන්තුවේ පළපුරුදු අභිචෝදකයෙක් ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට උපකාර කිරීම සඳහා ඔබ සහ අනෙකුත් නීතිඥයන් සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කරනවා.

නිලබලවාදය වෙත අවධානය කේන්ද්‍රකිරීම වෙනුවට සියළුම දෙනාට යුක්තිය ලබාදීම සඳහා අධිකරණවල මෙහෙයුම් කටයුතු නවීකරණය කරන්නට ශ්‍රී ලංකාව ගන්නා වෑයම් සඳහා ද එක්සත් ජනපදය සහය ලබා දුන්නා.

සියළු දෙනා යනුවෙන් මා අදහස් කරන්නේ සියළුම දෙනායි.

සියළුදෙනා ඇතුළත් කරගැනීම නොහොත් සර්වග්‍රහණය එක්සත් ජනපද රජයේ මූලික මූලධර්මයක් වනවා, එමෙන්ම එය නීති වෘත්තියේ ද මූලික ප්‍රතිපත්තියක් වනවා. නීති වෘත්තිය පදනම් වී ඇත්තේ සාධාරණ, වගවීමෙන් යුත් සහ යුක්තිසහගත සේවා සැපයීම මත වන අතර ඔබේ නියෝජනය තුළ සහ ඔබේ ප්‍රවේශය තුළ ඔබ සර්වග්‍රාහී වනු ඇතැයි පුරවැසියන් අපේක්ෂා කරනවා.

එක්සත් ජනපදයේ අප, මේ මූලික මූලධර්ම ආරක්ෂා කරමින් ජීවත්වීමට දරන වෑයම තුළ බොහෝ දේ ඉගෙන ගෙන තිබෙනවා, අපට විවිධ අභියෝගවලට මුහුණ දෙන්නටත් සිදුවුවා.

වසර සියයකටත් අඩු කාලයකට පෙර, අප්‍රිකානු ඇමරිකානුවන්ට එක්සත් ජනපද නීතිඥ සංගමයට බැඳීම තහනම් වී තිබුණා. 1918 වන තෙක් කාන්තාවන්ට එක්සත් ජනපද නීතිඥ සංගමයට ඇතුළු වීමට අවසර නොලැබුණු අතර, ඊට දශක ගණනාවකට පසුවත්, නීතිඥයින් ලෙස කටයුතු කරන කාන්තාවන් සිටියේ සුළු පිරිසක් පමණයි. දැන්, එක්සත් ජනපදයේ නීතිඥයින් ලෙස කටයුතු කරන අයගෙන් තුනෙන් එකකට වඩා පිරිසක් කාන්තාවන් වනවා. ජාතිය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් පැවති, එම නියෝජන

හිඩැස් වසා දැමීමට අප තවමත් කළ යුතු වැඩ බොහෝ තිබෙනවා. කෙසේ වෙතත්, නීති වෘත්තිය ප්‍රගුණ කිරීම තුළ නියෝජනය වන්නා වූ අපගේ විවිධත්වය සැමට යුක්තිය ඉටු කරන අතර අපගේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන බව අපි ඉගෙන ගෙන තිබෙනවා.

ශ්‍රී ලංකාවේ නීති වෘත්තිකයින් වශයෙන් ඔබට ඒ මග පෙන්වීමේ වගකීම පැවරෙනවා- ඔබ එය කරමින් සිටිනවා! මට මෑතකදී ඉතා සිත්ගන්නාසුළු සංඛ්‍යාලේඛන අසන්නට ලැබුණා. 2022 වර්ෂයේ නීතිවේදී සංගමයට ඇතුළත් කරගත් නීතිවේදීන් 1081 අතරින් සියයට 64කට වැඩි ප්‍රමාණයක් කාන්තාවන් බව මට දැනගන්නට ලැබුණා.

එබැවින් නීතියේ ආධිපත්‍යය පවත්වා ගැනීම සඳහා ඔබ දක්වන කැපවීම, ඔබේ අධ්‍යාපනය දිගටම කරගෙන යාමට ඇති ඔබේ කැමැත්ත, වෙනස් වීමට ඔබේ විවෘතභාවය සහ මහජනතාවගේ ගැටලුවලට හඬක් දීමට ඔබේ ධෛර්යය ගැන මම ඔබට ප්‍රශංසා කරනවා. නීති වෘත්තියේ විවිධත්වය, ප්‍රතිසංවිධානය සහ කඩිසර බව ඉදිරියට ගෙන යාමට මෙම නායකත්ව ලක්ෂණ ඔබට උපකාර වනු ඇතැයි මට විශ්වාසයි.

නීති වෘත්තියේ අනාගතය හැඩ ගස්වමින්, දිගින් දිගටම යුක්තිය සඳහා සමාන ප්‍රවේශය සොයායන සහ ලබාදෙන ඔබේ ගමනේ දී, යහපැවැත්ම සහ වෘත්තීය සංවර්ධනය ද හඹා යන මෙන් මා ඔබව දිරිගන්වනවා. කාලයකට පෙර, මගේ වෘත්තීය මංපෙත තෝරාගනන අවස්ථාවේ මා සිහින මැවූ ජනතාව වෙත සේවය කිරීමේ ආත්මය ඔබ තුළින් ප්‍රතිමූර්තිමත් වනවා.

සියළුදෙනාට යුක්තිය ලබාදීම සඳහා ශ්‍රී ලංකාව ඉදිරියට ගෙන යන්නා වූ ඒ මාර්ගය ඔස්සේ නොපසුබටව සහ සෘජුව ගමන් කරන්නට මා ඔබව දිරිගන්වනවා.

අවසාන වශයෙන්, අද මට කතා කිරීමට ආරාධනා කිරීම ගැනත්, අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණවල පෙරමුණේ සිටින ඔබේ නායකත්වය ගැනත් මම ශ්‍රී ලංකා නීතිඥ සංගමයට නැවතත් ස්තූතිවන්ත වනවා. මාසය අවසානයේ දී සිය නිල කාලය අවසන් වන නීතිඥ සංගමයේ සභාපති සාලිය පීරිස් මහතා ද පිළිගැනීමට ලක්කරන්නට මා කැමතියි. ඔහු නීතියේ ආධිපත්‍යය වෙනුවෙන් නොසැලී, ධෛර්ය සම්පන්නව සහ විවෘතව කතා කළ අයෙක් බව අපි කවුරුත් දන්නවා. සාලිය, ඔබට ස්තූතියි.

අධිකරණ කේෂ්ත්‍රය ශක්තිමත් කිරීමට සහ නවීකරණය කිරීමට දක්වන කැපවීම පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයට සහ අනෙකුත් අධිකරණ ක්ෂේත්‍ර ආයතනවලට ස්තූතිය පුද කිරීමට මා කැමතියි. ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව සහ සඵලතාවය වැඩිදියුණු කිරීම සඳහා ඔබ සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ලැබීම ගෞරවයක්.

ඔබ හැමදෙනා ඔබට පැවරී ඇති කාර්යය කුමක්දැයි, මේ යුගයේ මේ මොහොතේ ඔබේ භූමිකාව කුමක්දැයි දන්නවා. මේ කාමරය තුළ අවට බලන කළ ඔබ අතරේ වීරයින් ඔබට දිස්වනු ඇතැයි මා සිතනවා. මගේ පුතාත් මමත් වොන්ඩර් වුමන් ඇතුළු ජස්ටිස් ලීගයේ වීරයින් ගැන තිබෙන බොහෝ

චිත්‍රපට නරඹනවා. අද මා පැළඳ සිටින මේ පදක්කම එවැන්නක්. ඔවුන්ගේ එක් ආදර්ශ පාඨයක් වන්නේ "ඔබට තනිවම ලෝකය බේරාගත නොහැකියි" යන්නයි. ඔබ හැමදෙනා එක්වූ කල, අධිකරණයේ ස්වාධීනත්වය හා අවංකත්වය මෙන්ම නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීමට හෝ දේ කළ හැකියි.  ස්තුතියි.